ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 ජූලි 05 විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 අගෝස්තු 15 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ඔක්තෝබර් 10 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛණයේ පෙර වර්ෂයන්ගේ සිදුවූ වැරදි නිවැරදි කිරීම් ලෙස ලී බඩු හා සවි කිරීම්, ඉඩම් හා ගොඩනැගිලි, මෝටර් රථ හා කරත්ත වල රු.1,816,193 ක වටිනාකමක් වත්කම් අඩු කිරීම් ලෙස සමුච්චිත අරමුදලට ගැලපීම් නොකර ප්‍රාග්ධන යෙදුමින් ආදායමට දායකවීමේ ගිණුමට ගැලපීම් කර තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ස්ථාවර වත්කම් රු.1,816,193 ක මුදල සම්මුච්චිත අරමුදලට ගැලපීම් කොට 2019 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරනු ලැබේ. |
| (ආ) | 2016 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.31,600 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර සමුච්චිත අරමුදලට ගැලපීම් නොකර වර්ෂයේ මිලදී ගැනීමක් ලෙස සඳහන් කරමින් ප්‍රාග්ධන යෙදුමින් ආදායමට දායකවීමේ ගිණුමට ගැලපීම් කර තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2016 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.31,600 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර වල වටිනාකම ද 2019 වර්ෂයේ දී නිවැරදි කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.1,528,889 ක උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

1.3.2 නොසැසඳුනු ගිණුම්

පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තැන්පතු ශේෂ 4ක් හා ඒවාට අදාළ උපලේඛන අතර රු.170,725 ක නොසැසඳීම් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිමි. |

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.130,621 ක් වූ තැන්පතු විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂය හඳුනා ගැනීමට අවශ්‍ය සාක්ෂි ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී උපලේඛණ සොයා බලා එය නිවැරදි ලෙස 2019 වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

1.4.1 නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 571 | වසර 02 ක් ඉක්මවූ රු. 434,870 ක් වූ විවිධ තැන්පතු හා ආදායම් වෙනුවෙන් තැන්පතු 37ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | දෙන ලද උපදෙස් අනුව මෙම වර්ෂයේදී තැන්පතු ආදායම නිරවුල් කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 396 (ඇ) | මාස 6 ක් ඉක්මවූ රු. 4,418 ක් වූ චෙක්පත් 2 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ පිළිබඳව ආදායකයින් දැනුවත් කර මුදල් රෙගුලාසි 396 (ඇ) අනුව කටයුතු කිරීමට සටහන්කර ගතිමි. |
| | (iii) මුදල් රෙගුලාසි 1645 (ආ) සහ 1646 | වාහන 13 ක ධාවන සටහන් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරි මාසයේ සිට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| | (iv) මුදල් රෙගුලාසි 880 | ඇප තැබිය යුතු නිලධාරීන් 05 දෙනෙකු ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නිලධාරීන් පස්දෙනාගේ ඇප මුදල් තැම්පත් කිරීමට මෙම වර්ෂය අවසන් වීමට පෙර පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව<br>---------------------------- | | | |
| | (i) 217 වැනි රීතිය | නියමිත ආකෘතියෙහි දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යායුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනයක් සකස්කර තිබුනද එය ක්‍රමානුකූලව නඩත්තු කරගෙන යාමට කාර්යය මණ්ඩලය නොසිටි අතර, ඉදිරියේදී සියල්ල සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි. |
| | (ii) 218 වැනි රීතිය | සියළුම ඉඩම් හා ගොඩනැගිළි වාර්ෂිකව සමීක්ෂණය කර නොතිබුණි. | වාර්ෂිකව ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කර නිවැරදි වටිනාකම් ගිණුම්වල දැක්විය යුතු වේ. | අදාල නිලධාරීන්ගේ හිඟය නිසා මෙම කාර්යයන් අඩපන විය. නිලධාරීන් ලද වහාම සියල්ල නිවැරදිව සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව දන්වමි. |

2. මූල්‍ය සමාලෝචනය
---------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු .3,217,338 ක් වූ අතර ඊට ,අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු .1,729,746 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 50 | 31 | 31 | - | - | - | - | - |
| කුලී | 2,165 | 3,336 | 3,647 | 188 | 1,860 | 1,964 | 1,858 | 106 |
| බලපත්‍ර ගාස්තු | 126 | 124 | 124 | - | 119 | 130 | 130 | - |
| වෙනත් ආදායම් | 1,404 | 2,259 | 2,259 | 5453 | 1,158 | 1,754 | 1,754 | - |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු
--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 හා 2018 වර්ෂයන් සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. |

2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් කුලියට දී ඇති කඩකාමර හා කුලී නිවාසවල මාසික කුලී මුදල රු.1,580 ත් රු.2,180ත් අතර විය. නමුත් එම කඩකාමර සහ කුලී නිවාස නැවත තක්සේරු කර වර්තමානයට ගැළපෙන මාසික කුලියක් අය කිරීමට හා රු.188,414 ක් වූ හිඟ කුලී අයකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු කර නොතිබුණි. | කඩකාමර හා කුලී නිවාස තක්සේරු කිරීම හා හිඟ කුලී අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ මුල් භාගය වන විට 2018 වර්ෂයේ කඩ කුලී ආදායමින් 75% ක් පමණ අයකරගෙන ඇති අතර ඉදිරි වර්ෂයේ සභාව සතු කඩ කාමර හා කුලී නිවාස ටෙන්ඩර් කර වර්තමානයට ගැලපෙන මාසික කුලියක් ලබා ගැනීමට ගරු සභාව තීරණය කර ඇත. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. | සමස්ථ නැගෙනහිර පළාතේම කිසිදු පළාත් පාලන ආයතනයක මේ වන විට සම්මත අතුරු ව්‍යවස්ථා හෝ ක්‍රියාත්මක වන්නේ නැත. කෙසේ වෙතත් පළාත් සභාව සමඟ එක් වී ඉදිරියේදී අත්‍යවශ්‍ය අතුරු ව්‍යවස්ථා හෝ පනවා සම්මත කර ගැනීමට අවශ්‍යය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 අනුව 2018 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි | ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වේ. | කාර්යය මණ්ඩල නිලධාරි සංඛ්‍යාව ප්‍රමාණවත් පරිදි ලද වහාම මෙම සැලසුම් නිසි ලෙස සකස් කර ගනු ලැබේ. |

(ඇ) කාර්යයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | වර්ෂයේ ආරම්භයේ සිට ක්‍රමවත් සැලැස්මකට අනුකූලව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | ව්‍යාපෘති සකස් කිරීම සඳහා කාර්මික නිලධාරියෙකු නොමැති වූ බැවින් මෙම වර්ෂයේදී ඒවා ක්‍රියාත්මක කළ බව කාරුණිව දන්වා සිටිමි. |

(ඇ) පරිසර බලපත්‍ර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පාරිසරික හානි සිදු වන වී මෝල්, වඩු කර්මාන්ත සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාවසායන් 19 ක් පරිසර බලපත්‍ර ලබා ගැනීමකින් තොරව කර්මාන්ත පවත්වා ගෙන යමින් තිබුණි. | පාරිසරික බලපත්‍ර ලබාගත යුතු ව්‍යාවසායන් සඳහා බලපත්‍ර ලබාදීම කළයුතු වේ. | 2018 වර්ෂයේ ආදායම් පරික්ෂකවරයෙකු නොසිටි අතර දැනට තාවකාලික නිලධාරියෙකු අනුයුක්ත කර ඇති බැවින් අදාල පරිසර බලපත්‍ර නිකුත් කල යුතු කර්මාන්ත හඳුනාගෙන ඔවුන්ට බලපත්‍ර ලබා ගන්නා ලෙස දැනුම් දීමටත් එසේ නොකල හොත් නීත්‍යානුකූලව කටයුතු කිරීමට මහජන සෞඛ්‍ය පරික්ෂකවරයාගේ සහයෝගය මත ක්‍රියා කිරීමටත් කටයුතු කරමි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන නොතිබුණු | තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන | ප්‍රාදේශීය සහා මට්ටමින් ක්‍රියාත්මක කළ හැකි තිරසර |

| | | |
|---|---|---|
| අතර ඒ පිළිබඳ දැනුවත් භාවයක් ලබා ගෙන නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුවේ. | සංවර්ධන ඉලක්ක හදුනාගෙන එම ඉලක්කගත අරමුණු ඉටුකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව මෙයින් කාරුණිකව දන්වා සිටිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් පාලන මහජන නියෝජිතයින් සඳහා සහනදායී පදනමට යතුරුපැදි ලබා දීමේ වැඩසටහන යටතේ සභිකයන් 08 දෙනෙකුගෙන් අයකරගත් රු.362,870 ක මුදල ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නොයවා පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | අප්‍රමාදව අදාළ මුදල අයවැය දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේදී ඒ පිළිබඳව සොයා බලා එම මුදල ජාතික අයවැය දෙපාර්තමේන්තු වෙත යැවීමට කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩල විස්තරයට අනුව තනතුරු 8 කට අදාළව පුරප්පාඩු 14 ක් පැවතුණි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ සේවක හිඟය පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා පළාත් ආණ්ඩුකාරවරයා දක්වා හැකි සෑම ආකාරයෙන්ම ඉල්ලීම් සිදුකර ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පෙරටු කාර්යාල ස්ථාපනය කිරීමේ වැඩසටහන 2017 යටතේ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන වලින් රු.283,998 ක් වටිනා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබූ අතර 2018 වර්ෂයේ දී පරිගණක හා උපාංග කට්ටල 03 ක් හා මුද්‍රණ යන්ත්‍රයක් එම අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණි. සභාව 2019 ජූලි 30 දින වන විටද පෙරටු කාර්යාලයක් ස්ථාපනය | පෙරටු කාර්යාලය ස්ථාපිත කිරීම හා වත්කම්වල කල්පැවැත්ම තහවුරු වන පරිදි කටයුතු කළ යුතු වේ. | ප්‍රමාණවත් නිලධාරීන් නොමැති නිසාම මෙම පෙරටු කාර්යාල වැඩසටහන කිසිසේත් ක්‍රියාත්මක කල නොහැකිව ඇත. පසුගිය වර්ෂයේ සිට දැඩි නිලධාරීන් හිඟයකට පත්ව ඇති මෙම කාර්යාලයේ කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නම් අනුමත කාර්යය මණ්ඩලය සම්පූර්ණ විය යුතුය. දැනට |

| | | |
|---|---|---|
| නොකිරීම නිසා එම උපකරණ මේ වන විට විනාශ වෙමින් පැවතුණි. | | උපාංග සියල්ල සුරක්ෂිතව ඇති බැවින් ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් ලබා දෙන්නේ නම් කඩිනමින් පෙරටු කාර්යාල සංකල්පය ස්ථාපනය කර මහජන සේවාව විධිමත් කළ හැකිවන බව කාරුණිකව දන්වා සිටිමි. |

3.5 වත්කම් කළමනාකරණය

-------------------------------

3.5.1 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මිට්ෂුබිෂි කැබ් රථය 2004 වර්ෂයේ සිට ද, ට්‍රැක්ටරය 2008 වර්ෂයේ සිටද, පැරණි ජල බවුසරය 2016 වර්ෂයේ සිටද, භාවිතයට නොගෙන ඉවත් කර තිබූ අතර, ඒවා අවත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට 2019 ජූලි 30 දින වන විටද කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම වාහන දෙකම අළුත්වැඩියා කළ නොහැකි තත්වයේ පවතී. එසේම මේවායේ ලියාපදිංචි සහතික නොමැති වීම නිසා පසුගිය භාණ්ඩ සමීක්ෂණ ගණනාවකම අපහරණ නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි. කෙසේ වෙතත් කඩිනමින් මෙම රථ දෙක අපහරණය කිරීමට කටයුතු කරමි. |

3.6 ප්‍රසම්පාදනය

----------------

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 අනුව 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වේ. | ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් ලද වහාම මෙම සියලු සැලසුම් සකස්කර නඩත්තු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |